BOI
SRI LANKA

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මිල ගණන් කැඳවීම (2026/2028)

*(BOI/S&S/Q/077/2025)*

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වසර දෙකක (02) කාලයක් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම පිණිස ප්‍රවාහන පහසුකම් සැපයීමේ පළපුරුද්ද ඇති පිළිගත් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

මාර්ග විස්තර හා බස්රථයේ ආසන සංඛ්‍යාව පහත දැක්වෙන අතර, එක් එක් මාර්ගයට එක් බස්රථයක් හෝ මෝටර්කෝච් බැගින් සැපයිය යුතුය. සෙනසුරාදා, ඉරිදා සහ වෙළඳ නිවාඩු දිනයන්හි ප්‍රවාහන පහසුකම් අවශ්‍ය නොවේ.

1. <u>කොළඹ කොටුව ආයෝජන මණ්ඩල ප්‍රධාන කාර්යාලයට පැමිණීම හා ආපසුයෑම.</u>

| මාර්ගය | අවශ්‍ය අවම ආසන ප්‍රමාණය (රියදුරු ආසනය හැර) |
|---|---|
| 1.1 දෙල්ගොඩ සිට කොළඹ | 27 |
| 1.2. හොරණ සිට කොළඹ | 28 |
| 1.3. පාදුක්ක සිට කොළඹ | 24 |
| 1.4. මත්තේගොඩ සිට කොළඹ | 26 |
| 1.5. නිට්ටඹුව සිට කොළඹ | 32 |
| 1.6. තලවතුගොඩ සිට කොළඹ | 27 |
| 1.7. කළුතර සිට කොළඹ | 23 |
| 1.8. මීගමුව සිට කොළඹ | 21 |
| 1.9. නවගමුව සිට කොළඹ | 23 |

2. <u>කටුනායක අපනයන සැකසුම් කලාපයේ ආයෝජන මණ්ඩල කාර්යාලයට පැමිණීම හා ආපසුයෑම.</u>

| මාර්ගය | අවශ්‍ය අවම ආසන ප්‍රමාණය (රියදුරු ආසනය හැර) |
|---|---|
| 2.1. කොළඹ සිට කටුනායක | 26 |
| 2.2. දංකොටුව සිට කටුනායක | 15 |
| 2.3. නිට්ටඹුව සිට කටුනායක | 13 |
| 2.4. ගම්පහ සිට කටුනායක | 14 |

3. <u>බියගම අපනයන සැකසුම් කලාපයේ ආයෝජන මණ්ඩල කාර්යාලයට පැමිණීම හා ආපසුයෑම.</u>

| මාර්ගය | අවශ්‍ය අවම ආසන ප්‍රමාණය (රියදුරු ආසනය හැර) |
|---|---|
| 3.1. කඩවත සිට බියගම | 15 |
| 3.2. යක්කල සිට බියගම (ගම්පහ හරහා) | 15 |
| 3.3. මහරගම සිට බියගම | 18 |

4. <u>කොග්ගල අපනයන සැකසුම් කලාපයේ ආයෝජන මණ්ඩල කාර්යාලයට පැමිණීම හා ආපසුයෑම.</u>

| මාර්ගය | අවශ්‍ය අවම ආසන ප්‍රමාණය (රියදුරු ආසනය හැර) |
|---|---|
| 4.1. කරාපිටිය සිට කොග්ගල (ගාල්ල හරහා) | 13 |

5. <u>මහනුවර කර්මාන්ත උද්‍යානයේ ආයෝජන මණ්ඩල කාර්යාලයට පැමිණීම හා ආපසුයෑම.</u>

| <u>මාර්ගය</u> | <u>අවශ්‍ය අවම ආසන ප්‍රමාණය</u> (රියදුරු ආසනය හැර) |
|---|---|
| 5.1. පේරාදෙණිය සිට මහනුවර කර්මාන්ත උද්‍යානය | 13 |

මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛන පරීක්ෂා කිරීමේ විස්තර සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) (දු.ක 011- 2427190) වැඩිදුර විස්තර දැනගැනීම, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01. (දු.ක 011- 2427346 / 077-9147662) වෙතින් සිදුකල හැක.

**2025.11.19** වන දින දක්වා රාජකාරි දිනවල පෙ.ව. 9:00 සිට ප.ව. 3:00 දක්වා රු. 3000/- (SSCL බදු මුදල සහිතව) + 18% VAT ඇතුළුව නැවත නොගෙවන ගාස්තුවක් ගෙවා ඉහත ලිපිනයේ පිහිටි පරිපාලන දෙපාර්තමේන්තුවේ සැපයුම් අංශය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛනය ලබාගත හැක. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා එක් අයදුම්පතක් පමණක් ලබාගැනීම ප්‍රමාණවත් වේ.

මෙම ප්‍රසම්පාදනයට අදාල පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) **2025.11.11** වන දින පෙ.ව. 10.00 ට පරිපාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි දී පැවැත්වීමට නියමිතය. අයදුම්පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය **2025.11.19** වන දින දක්වා වේ.

මුද්‍රා තබන ලද මිල ගණන් සමඟ රු. 20,000/- ක ආපසු ගෙවනු ලබන මුදල් ඇපකරයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තැන්පත් කළ යුතුය. එක් සැපයුම්කරුවෙකුට ඉහත එක් මාර්ගයකට හෝ මාර්ග කීපයකට වුවද මිල ගණන් ඉදිරිපත් කළහැකි අතර එම එක් එක් මාර්ගය සඳහා වෙන වෙනම මිල ගණන් සමඟ වෙන වෙනම මුදල් ඇපකර තැන්පත් කළ යුතුය.

මුද්‍රා තබන ලද සියලු විස්තර ඇතුළත් මිල ගණන් **2025.11.20** වන දින ප.ව. 2:00 ට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව II, අධ්‍යක්ෂ (පරිපාලන) බාරේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ඉහත ලිපිනයේ පිහිටි සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කළයුතුය. එදිනම ප.ව. 2:00 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර එම දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන මිල ගණන් පත්‍ර බාරගනු නොලැබේ.

මිල ගණන් ඉදිරිපත් කරන අයට හෝ බලයලත් නියෝජිතයෙකුට හෝ එම අවස්ථාවට සහභාගිවිය හැකි ය.

මිල ගණන් බහා එවන ලියුම් කවරයෙහි ඉහළ වම් කෙලවර **" ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම 2026/2028 "** යනුවෙන් සඳහන් කළයුතුය.

ප්‍රවාහන කොන්ත්‍රාත්තුව සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**පෙර වර්ෂයන්හි අසතුටුදායක සේවාවන් සපයන ලද හා අත්හිටුවන (Suspended) ලද බස් සේවාවන් සලකනු නොලබයි.**

සභාපති
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය